# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2461/16 – 2025 නොවැම්බර් මස 03 වැනි සඳුදා – 2025.11.03**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2019/202.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

ජාතික සේවක සංගමය, 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

සහ

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, මැක්ඩොවල් බලකොටුව මාවත, පළමු පටුමග, 34/64, ඒ. බී. හේරත් මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

1A – G 045707 – 13 (2025/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2019/202.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජාතික සේවක සංගමය, 416, කෝට්ටේ පාර, පිටකෝට්ටේ.

සහ

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව, 94, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

"ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ ලිපිකරුවෙකු ලෙස සේවය කළ ඩබ්. එම්. වික්‍රමරත්න මහතාට පහත සඳහන් කරුණු මගින් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.

1. ප්‍රධාන ගබඩා පාලක විශ්‍රාම ගැනීමෙන් පසු එම තනතුරට හිමි රාජකාරි 2016.02.16 දින සිට ඉටු කරවාගෙන තනතුරට හිමි වරප්‍රසාද ලබා නොදීම.
2. ප්‍රධාන ගබඩා භාරකරු තනතුර වෙනුවට ගබඩා හා තොග පාලන නිලධාරි තනතුර විධිමත්ව අනුමත කර ගැනීමකින් තොරව එම තනතුරේ වැඩ බැලීමට 2016.02.16 දින පත් කර 2020.02.01 දින සිට එම තනතුර සහ වැඩ බැලීමේ දීමනාව අත්හිටුවීම."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 – 0031

---

මගේ අංකය: IR/COM/02/2024/170.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

කේ. ජී. සමන් ප්‍රියදර්ශන මයා, අංක 09 බී/26එල්, ජාතික නිවාස ක්‍රමය, රද්දොළුගම.

සහ

උපාලි නිවුස් පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 223, බ්ලූමැන්ඩල් පාර, කොළඹ 13.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ගාල්ල, කිතුලම්පිටිය, වේවැල්වල පාර, 10/51, වසන්ත වික්‍රමරත්න පුංචිහේවා මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2024/170.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. ජී. සමන් ප්‍රියදර්ශන මයා, අංක 09 බී/26එල්, ජාතික නිවාස ක්‍රමය, රද්දොළුගම.

සහ

උපාලි නිවුස් පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 223, බ්ලූමැන්ඩල් පාර, කොළඹ 13.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

"උපාලි නිවුස් පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ වසර 10ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර සේවයෙන් ඉවත්ව යන සේවකයින්ට පාරිතෝෂික ගෙවීමේ දී සේවා කාලයේ වසරකට මාසයක වැටුප පදනම් කර ගනිමින් පාරිතෝෂික ගෙවීමේ ක්‍රමවේදය වෙනස් කර මෙම පැමිණිලිකරුට පාරිතෝෂික ගෙවීමේ දී වසරකට මාස 1/2 පදනම් කර ගනිමින් පාරිතෝෂික මුදල් ගෙවීම තුළින් ඔහුට යම් අසාධාරණයක් සිදුවී තිබේද එසේ සිදුවී තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ඔක්තෝබර් මස 14 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 11 – 0032

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.